# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| **නිකුත් කළේ** | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| **දිනය** | 2022.10.17 |

## ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - 2022 සැප්තැම්බර්

**ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක වලට අනුව 2022 සැප්තැම්බර් මාසයේ දී, සේවා ක්‍රියාකාරකම්වල සුළු ඉහළ යෑමක් සහ නිෂ්පාදන ක්‍රියාකාරකම්වල පහත වැටීමක් දක්නට ලැබුණි.**

**පෙර මාසයට සාපේක්ෂව නිෂ්පාදන ක්‍රියාකාරකම්හි පසුබෑමක් පෙන්නුම් කරමින්, නිෂ්පාදන අංශයේ ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශකය 2022 සැප්තැම්බර් මාසයේ දී පහළ යන ලදී.** ඒ අනුව, නිෂ්පාදන අංශයේ ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශකය 2022 සැප්තැම්බර් මාසයේ දී පෙර මාසයට සාපේක්ෂව දර්ශකාංක 7.0කින් පහළ යමින් 42.6ක අගයක් වාර්තා කරන ලදී. මේ කෙරෙහි සේවා නියුක්තිය සහ ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය යන උප දර්ශක හැර අනෙකුත් සියළුම උප දර්ශකයන්ගේ සිදු වූ පහළ යෑම් හේතු විය.

| නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය | 2022 අගෝස්තු මාසයට සාපේක්ෂව දර්ශකාංක 7.0 ක පහළ යෑමකි |
|---|---|
| **42.6** | |

නව ඇණවුම් සහ නිෂ්පාදන පහළ වැටීම කෙරෙහි ආහාර හා පාන වර්ග නිෂ්පාදන සහ රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන යන අංශයන්හි දක්නට ලැබුණු පසු බෑසීම ප්‍රධාන වශයෙන් දායක විය. පාරිභෝගිකයන්ගේ මිලදී ගැනීමේ ශක්තිය පිරිහීම හේතුවෙන් මෙලෙස ඉල්ලුම පහත වැටුණු බව, ආහාර සහ පාන වර්ග නිෂ්පාදන අංශය ද ඇතුළුව ප්‍රධාන වශයෙන් දේශීය වෙළඳපොළ අරමුණු කරගෙන නිෂ්පාදන කටයුතුවල නියැලෙන බොහෝ ප්‍රතිචාර දැක්වූවන් සඳහන් කරන ලදී. තවද, ප්‍රධාන අපනයන ගමනාන්තයන්හි ආර්ථික අවපාතයන් අත්වීමට ඇති ඉඩකඩ පිළිබදව පවතින බිය හේතුවෙන් විදේශීය ඉල්ලුමෙහි ද අඩු වීමක් දක්නට ලැබෙන බව අපනයනාභිමුඛ කර්මාන්තවල යෙදී සිටින නිෂ්පාදකයින් සඳහන් කරන ලදී. එසේ වුව ද, රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන අංශයේ සේවා නියුක්තියේ වර්ධනයක් දක්නට ලැබුණ අතර සමස්ත සේවා නියුක්තිය පෙර මාසයේ පැවති මට්ටමෙහිම පැවතුණි. සේවක හිඟයෙන් නිතර පීඩා විඳින ඇඟළුම් කර්මාන්තය, ව්‍යාපාර පිළිබඳව ඉදිරි දැක්ම යහපත් නොවන තත්ත්වයක වුව ද, යහපත් ශ්‍රම සැපයුමක් පවතින වාතාවරණය ප්‍රයෝජනයට ගනිමින් එම අංශයට සේවා නියුක්තිකයන් බඳවා ගැනීමට නැඹුරු වී ඇත. නව ඇණවුම් සහ නිෂ්පාදන අඩු වීමට සමගාමීව තොග මිලදී ගැනුම් අඩු වූ අතර ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය 2022 සැප්තැම්බර් මාසයේ දී සුළු වශයෙන් වර්ධනය විය. මෑත කාලීනව යම් ප්‍රගතියක් දක්නට ලැබුණ ද අඩු විදේශ විනිමය ලබා ගැනීමේ අපහසුතා තවදුරටත් පැවැතීම හේතුවෙන් අමුද්‍රව්‍ය සපයා ගැනීමේ දුෂ්කරතාවන්ට තමන් අඛණ්ඩව මුහුණ දෙන බව සමහර ප්‍රතිචාර දැක්වූවන් සඳහන් කරන ලදී.

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

| විචල්‍යය | අගෝ. | සැප්. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **49.6** | **42.6** | **-** | වැඩි වේගයකින් පහළ යෑමක් |
| | | **උපදර්ශක** | | |
| නව ඇණවුම් | 49.0 | 37.5 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| නිෂ්පාදන | 49.0 | 39.0 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| සේවා නියුක්තිය | 52.0 | 50.5 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 51.5 | 38.9 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 47.5 | 51.0 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඉදිරි මාසවල දී ඉල්ලුම් අංශයේ පවතින බාධාවන් වර්ධනය වීමට ඇති හැකියාව හේතුවෙන්, ඉදිරි මාස තුන තුළ නිෂ්පාදන කටයුතු සඳහා වන අපේක්ෂාවන් 2022 සැප්තැම්බර් මාසයේ දී පහත වැටෙන ලදී.

### ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

නිෂ්පාදන අංශයෙහි ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2022 අගෝස්තු මාසයට සාපේක්ෂව දර්ශකාංක 0.5කින් පහළ යමින් 2022 සැප්තැම්බර් මාසයේ දී 49.8ක දර්ශක අගයක් වාර්තා කරන ලදී.

පෙර මාසයට සාපේක්ෂව 2022 සැප්තැම්බර් මාසයේ දී එක්සත් ජනපදය, සිංගප්පූරුව සහ රුසියාවේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය වැඩි වේගයකින් ද ඉන්දියාවේ අඩු වේගයකින් ද වර්ධනය විය. එසේ වුවද, යුරෝපා කලාපය, එක්සත් රාජධානිය සහ චීනය යන රටවල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය පෙර මාසයට සාපේක්ෂව සැප්තැම්බර් මාසයේ දී පහළ යන ලදී.

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)1 ආයතනය, 2022 ඔක්තෝබර් 14 වන දිනට*

[1] *එස්&පී ග්ලෝබල්* (S&P Global) *ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, එමඟින් යුරෝපා කලාපය ඇතුලුව රටවල් 30 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2022 සැප්තැම්බර් මාසයේ දී 51.2ක දර්ශක අගයක් වාර්තා කරමින් සුළු වර්ධනයක් පෙන්නුම් කළ අතර,** මේ සඳහා නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම් සහ අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම්වල ඉහළ යෑම හේතු විය.

ප්‍රධාන වශයෙන්, මූල්‍ය සේවා, නවාතැන් හා අහාරපාන සැපයීමේ සේවා සහ අධ්‍යාපන යන උප අංශවල දක්නට ලැබුණු ඉහළ යෑම් සමඟ, 2022 අගෝස්තු මාසයට සාපේක්ෂව 2022 සැප්තැම්බර් මාසයේ දී නව ව්‍යාපාර වර්ධනය විය.

ඉන්ධන හිඟය පහව යෑම සහ ආර්ථික තත්ත්වයන් වැඩිදියුණුවීම මධ්‍යයේ සේවා අංශයේ ව්‍යාපාර ක්‍රියාකාරකම් සැප්තැම්බර් මාසයේ දී තවදුරටත් ඉහළ ගියේය. ඒ අනුව, මූල්‍ය සේවා, අනෙකුත් පෞද්ගලික සේවා, අධ්‍යාපන සහ රක්ෂණ යන උප අංශවලට අදාළ ව්‍යාපාර ක්‍රියාකාරකම් පෙර මාසයට සාපේක්ෂව ඉහළ යෑම් වාර්තා කර ඇත. එසේ වුවද, දේපළ වෙළඳාම, තැපැල් හා කුරියර් සේවා සහ මහජන සෞඛ්‍ය කටයුතු යන උප අංශවල ව්‍යාපාර ක්‍රියාකාරකම් 2022 සැප්තැම්බර් මාසය තුළ පහත වැටුණි.

සේවයෙන් ඉවත්වීම් ඉහළ යෑම සහ විශ්‍රාම ගැනීම් වලට අමතරව නව බඳවාගැනීම් අත්හිටුවීම් හේතුවෙන් සැප්තැම්බර් මාසයේ දී සේවා නියුක්තිය අඛණ්ඩව පහළ ගියේය. මේ අතර, කාර්ය මණ්ඩලවලට මුහුණ දීමට සිදු වූ ප්‍රවාහන දුෂ්කරතා අවම වීම හේතුවෙන් නිමකිරීමට නියමිත කාර්යයන් තවදුරටත් පහළ ගියේය.

| විචල්‍යය | අගෝ. | සැප්. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **51.7** | **51.2** | **-** | **අඩු වේගයකින් ඉහළ යෑමක්** |
| | | **උපදර්ශක** | | |
| නව ව්‍යාපාර | 57.3 | 56.3 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 53.1 | 58.3 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 43.3 | 39.6 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 47.8 | 44.0 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 57.2 | 57.8 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ආර්ථික තත්ත්වයන්හි වැඩිදියුණුවීම සහ එළැඹෙන උත්සව සමය හේතුවෙන් වර්ධනය වූ සුබවාදී අදහස් සමගින්, ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන් 2022 සැප්තැම්බර් මාසයේ දී තවදුරටත් වර්ධනය විය. එසේ වුවද, බොහෝ ප්‍රතිචාර දක්වන්නන් විසින් සැපයුම් සම්බන්ධව පවත්නා දුෂ්කරතා, එකතු කළ අගය මත බද්ද වැඩිකිරීම, සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද හඳුන්වාදීම සහ සෘජු බදු වැඩිකිරීම වැනි තම ව්‍යාපාර මෙහෙයුම් කෙරෙහි සෘණාත්මක බලපෑම් ඇති කළ හැකි කරුණු පිළිබඳව කනස්සල්ල පළ කරන ලදී.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**51.2**

**2022 අගෝස්තු මාසයට සාපේක්ෂව දර්ශකාංක 0.5ක පහළ යෑමකි.**

සේවා අංශයෙහි
ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

ගෝලීය සේවා ක්‍රියාකාරකම්හි ස්ථායීතාවයක් පෙන්නුම් කරමින්, ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2022 අගෝස්තු මාසයේ පැවති 49.3 සිට 2022 සැප්තැම්බර් මාසයේ දී 50.0ක් වාර්තා කළේය.

ඉන්දියාව සහ ජපානය යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් එම රටවල සේවා අංශ පසුගිය මාසයට සාපේක්ෂව 2022 සැප්තැම්බර් මාසයේ දී වර්ධනයක් පෙන්නුම් කළ අතර, චීනය සහ එක්සත් රාජධානිය යන රටවල එය පහළ යෑමක් සහ ඇමරිකා එක්සත් ජනපදයේ එය නොවෙනස් මට්ටමක් පෙන්නුම් කළේය.

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2022 ඔක්තෝබර් 15 වන දිනට*

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමුද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.